# වැස්ස දවසක්



තනුලි නිමංසා අතාවුද

# වැස්ස දවසක්

## තනුලි නිමංසා අතාවුද


චිත්‍ර සහ කතෘගේ නම - ඊ.ඒ.ජී තනුලි නිමංසා අතාවුද
-2 ශ්‍රේණිය - A
-මහාමායා බාලිකා විද්‍යාලය



ISBN N0 -978-624-206-824-4

කර්තෘ ප්‍රකාශනයකි - ප්‍රථම මුද්‍රණය 2023 ඔක්තෝම්බර්

කර්තෘ ගේ වෙනත් කෘති - මලී

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023. 11 . 24

# පිදුම

අකුරින් අකුර ගලපන්න මා හට කියා දුන්
ආදරණීය මංජුලා ගුරුතුමියටත්, ගයනී
ගුරුතුමියටත් මා ගොතපු කතාවේ ලියන
වචන පේළි නිවැරදි කර සකස් කර දුන්
ආදරණීය මාගේ අම්මටත් අප්පච්චිටත්
ආදරයෙන් පිළිගන්වමි.




එදා ඉස්කෝලේ ගිහින් ගෙදර ඇවිත්
ඉස්කෝලෙන් දුන්න ගෙදර වැඩ කළා.
එකපාරටම මම දැක්කා.

ඉර හැංගිලා, නිල් පාට අහස කළු වෙලා යනවා.



මිදුලේ ගස් එහෙට මෙහෙට වැනෙමින් තදින් සුළං හමනවා. වැහිලිහිණියෝ අහස පුරා පියාඹනවා.





“පුතේ වහින්න එනවා.” රෙදි ටික ගන්න අම්මා කිවුවා.





මම මිදුලට ගිහින් රෙදි ටික ගත්තා. එතකොටම පුංචි පුංචි වැහි බිංදු වැටෙන්න වුණා.



පුංචි වැහි බිංදු ලොකු වැහි බිංදු වෙලා ලොකු වැස්සක් වැස්සා. අපේ මිදුල ඇළක් වගේ වතුරෙන් පිරුණා.

"නංගී එන්න අපි ඔරු හදමු" අයියා කිවුවා. අපි දෙන්නාම එකතු වෙලා කඩදාසි ඔරු හදලා පා කළා.



විදුලි කෙටුවා. මහ හඬින් ගෙරෙව්වා.

අපි ඉක්මනට ගෙට දිවුවා.




වැස්සේම අප්පච්චි වැඩ ඇරිලා ගෙදර ආවා.



අම්මා අපි හැමෝටම තේ අරන් ආවා. අපි සතුටින් තේ බිව්වා.



රෑ කෑම හදන්න අම්මා කුස්සියට ගියා. අපි හැමෝම කෑම හදන්න අම්මාට උදවු කළා.



අපි කෑම මේසය සූදානම් කරන්න අම්මට උදවු කළා.



අම්මාට හරිම සතුටුයි. ''මගේ හොඳ දරුවෝ'' අම්මා කිවුවා. 'පුංචි අපිත් අපේ අම්මාට තාත්තාට උදවු කරන්න පුරුදු වෙමු'.



# පසුවදන



නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නුතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිව්‍ය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ශක්තිය ලැබේවායි පතමු ..
මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023. 11. 24

ISBN -978-624-206-824-4